TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන.
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1 , එලිබැන්ක් පාර , කොළඹ.
2019.10.15.

EDB
16 OCT 2019

මහින්ද දේශප්‍රිය මහතා ,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය .

මහත්මයාණෙනි,

**<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයට අයත් පරිශ්‍රයන් අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය වන ආකාරයෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>**

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට 2019.10.15 දින ලැබී ඇති පැමිණිල්ලකට අනුව කොළඹ 10 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් පරිශ්‍රයේ ජනාධිපති අපේක්ෂකයන් දෙදෙනෙකුගේ රුව සහිත පෝස්ටර් ප්‍රදර්ශනය කර ඇත. මෙම සිදු වීමට අදාල ඡායාරූප ද මේ සමග අමුණා ඇත.

රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමි වල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය කිරීමට ඉඩ දීම 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 6(i) නියමය අනුව නීති විරෝධී වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංඛි අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 076 322 344 2 / 076 322 366 2 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය(TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට ,
විශ්වාසී ,

Lakwijaya Bandara
.................................
ලක්විජය බණ්ඩාර,
ජාතික සම්බන්ධීකාරක.

